රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : **17/2016**

මගේ අංකය: **CS/SLAS/ANN.TRA/SP - 2017**
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය.
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

**2016.06.29**

.

අමාත්‍යාංශ ලේකම්වරුන්,
ප්‍රධාන ලේකම්වරුන්,
කොමිෂන් සභා ලේකම්වරුන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිසාපතිවරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්.

**ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය - 2017**

1. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරීන් දිගින් දිගටම එකම සේවා ස්ථානයක රැඳී සිටීම නිසා අත්‍යවශ්‍ය සේවා ස්ථාන වල පවතින පුරප්පාඩු පිරවීමට නොහැකි වන තත්ත්වයක් පවතින බැවින් සහ එම නිලධාරීන්ට ස්ථාන මාරු ලබා ගැනීමට හැකි වන පරිදි රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් **2009.02.20** දිනැති අංක 1588/30 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්ය පරිපාටික රීති 1 වැනි කාණ්ඩයේ **XVIII** වැනි පරිච්ඡේදයේ 202 රීතියේ විධිවිධාන අනුව හා රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/ET/4/3/5/2012 හා **2016.06.23** දිනැති ලිපියෙන් සිදු කරන ලද සංශෝධනයන්ට යටත්ව ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරීන් සඳහා මෙම ස්ථාන මාරු පටිපාටිය ක්‍රියාත්මක කරනු ලැබේ.

**(අ) වාර්ෂික ස්ථාන මාරු කමිටු මගින් (වාර්ෂික ස්ථාන මාරු)**

ස්ථාන මාරුවීම් අපේක්ෂා කරන නිලධරයන්ගේ ඉල්ලීම් ඉටු කිරීම සඳහා වාර්ෂික ස්ථාන මාරු කමිටු ක්‍රියාත්මක කෙරේ. ඒ හැරුණු විට කිසියම් නිලධරයකුගේ සාධාරණ ඉල්ලීමක් ඉටු කිරීමට ඉඩ ලබා ගැනීම සඳහා හෝ අමාත්‍යාංශ ලේකම්වරුන්**,** විසින් පරිපාලනමය කරුණු අනුව කරනු ලබන නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිණිස සේවා ස්ථානයක/ප්‍රදේශයක නියමිත සේවා කාලය සම්පූර්ණ කළ නිලධරයකු වෙනත් සේවා ස්ථානයකට මාරු කිරීමද වාර්ෂික ස්ථාන මාරුවීම් කමිටුවට තීරණ ගත හැක. මෙම මාරුවීම් වර්ෂයේ ආරම්භක වැඩ කරන දිනයේ සිට ක්‍රියාත්මක වේ.

2. **වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත් වන නිලධරයන් පිළිබඳ විස්තර**

2.1 අමාත්‍ය මණ්ඩලය විසින් පත්කිරීම් කරනු ලැබූ නිලධාරීන් හැර මේ වන විටත් සේවයේ යෙදී සිටින විශේෂ ශ්‍රේණියේ නිලධරයන් අතුරින්, එක් සේවා ස්ථානයක ( පළාත් සභා ද ඇතුළත්ව) අවම වශයෙන් වසර පහ (05)ක් සම්පූර්ණ කර ඇති නිලධරයන් මෙම **පරිපාටිය** පරිදි ස්ථාන මාරුවීම් සඳහා යටත් වනු ඇත.

2.2 එක් සේවා ස්ථානයක අවම වශයෙන් වසර දෙක (02) ක් සම්පූර්ණ කර ඇති නිලධරයන් මෙම චක්‍රලේඛය පරිදී වාර්ෂික ස්ථාන මාරු අයදුම් කිරීමට සුදුසුකම් ලබනු ඇත.

3. **වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ සංයුතිය පිළිබඳ විස්තර**

රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යාංශ ලේකම් විසින් පහත නිලධරයන්ගෙන් සමන්විත ස්ථාන මාරු කමිටුව පත් කරනු ඇත.

1. වෙනත් අමාත්‍යාංශයක ලේකම්වරයෙක් - සභාපති
2. අතිරේක ලේකම් (රාජ්‍ය පරිපාලන)
3. අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා පරිපාලන සේවා ශාඛාව
4. ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමයේ නියෝජිතයෙක්

4. **වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුවේ සංයුතිය හා පිළිබඳ විස්තර**

4.1 වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන කමිටුව

1. රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යාංශය ලේකම් - සභාපති
2. ස්ථාන මාරු කමිටුවට ඇතුළත් නොවූ වෙනත් අමාත්‍යාංශ ලේකම්වරයෙක්
3. අතිරේක ලේකම් (රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය)

4.2. ස්ථාන මාරුවීම් වලට විරුද්ධව කරුණු දැක්වීම් ඉදිරිපත් කළ හැකි අවස්ථා මෙම චක්‍රලේඛය අනුව ස්ථාන මාරු සිදු කළද යම් සුවිශේෂී හේතුවක් මත නිලධරයකුට ලබා දී ඇති ස්ථාන මාරු සමාලෝචනය සලකා බැලිය හැකිය. එහිදී අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශ සමඟ ඉහත සඳහන් ස්ථාන මාරු සමාලෝචන කමිටුවට ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකිය

5. **වාර්ෂික ස්ථාන මාරු ලබා දීමේ දි සැලකිල්ලට ගන්නා වෙනත් පොදු කරුණු**

5.1 මෙම ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමේදී සේවා අවශ්‍යතාවයට ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

5.2 වාර්ෂික ස්ථාන මාරුවීම්වලදී කාලය ගණනය කරනු ලබනුයේ පෙර වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනටය. (උදා:-2017 වාර්ෂික ස්ථාන මාරු සඳහා 2016.12.31 දිනය.)

5.3 වාර්ෂික ස්ථාන මාරුවීම් වලට සේවා කාලය ගණනය කිරීමේදී සේවයේ ආරම්භක දිනය ලෙස සැලකිය යුත්තේ සේවයට වාර්තා කළ වර්ෂයේ ජනවාරි මස 01 වෙනි දිනයයි. නමුත් නිලධරයාගේ පාලන විෂයන් ඉක්මවා ගිය කරුණක් හේතුවෙන් සේවයට වාර්තා කළ දිනය පසු දිනයක් වේ නම් මාරු කමිටුව ඒ පිළිබඳව සැලකිල්ල යොමු කරයි.

5.4 යම් සේවා ස්ථානයක සේවය කළ කාලය ගණන් ගැනීමේදී, නිලධරයකුගේ පාලන විෂය ඉක්මවා ගිය හේතුවක් මත සේවයේ නොසිටි කාලය ගණන් ගනු නොලැබේ.

5.5 ස්ථාන මාරුවීම් ඉල්ලීමේදී සහ ස්ථාන මාරුවීම් වලට විරුද්ධව කරනු ලබන කරුණු දැක්වීම් ඉදිරිපත් කිරීමේදී සලකා බලනු ලබන්නේ ඒ සඳහා සකස් කර හඳුන්වා දෙනු ලබන ආදර්ශ ආකෘති පත්‍රයට අනුවම සකස් කළ අයදුම්පත් පිළිබඳව පමණි.

5.6 ස්ථාන මාරු නියෝගයක් ලැබූ සියලුම නිලධරයෝ, නියමිත දිනයේදී නව රාජකාරි ස්ථානය වෙත වාර්තා කිරීමට බැඳී සිටිති.

5.7 ස්ථාන මාරුවීම් නියෝග ලැබ සිටින නිලධරයකු එම මාරුවීම ක්‍රියාත්මක වන දිනයෙන් පසු එම ආයතනයේ සේවයෙන් මුදා නොහැරීම මෙම මාරු පටිපාටියට පටහැනි කරුණකි. වාර්ෂික ස්ථාන මාරු කමිටුව මඟින් අමාත්‍යාංශයෙන්/ දෙපාර්තමේන්තුවෙන් පිටතට ස්ථාන මාරුවීම් ලබා දී ඇති නිලධරයන් අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් රඳවා නොගෙන, නියමිත දින නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකි වන සේ ඔවුන් මුදා හැරීමට කටයුතු කළ යුතුය.

5.8 වාර්ෂික ස්ථාන මාරුවීම් පටිපාටියෙන් පරිබාහිර අවස්ථා

මෙම ස්ථාන මාරුවීම් පටිපාටියට බාහිරව සිදුකරන විශේෂ ස්ථාන මාරු ඉල්ලීම් අදාළ රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ / පළාත් සභා ප්‍රධාන ලේකම්ගේ නිර්දේශ සහිතව රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ ඉදිරිපත් කරන ලද ඉල්ලීමට හේතු වූ කරුණු පිළිබඳව සෑහීමකට පත් වන්නේ නම් රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් විසින් එම ඉල්ලීම් සලකා බලා තීරණයක් ලබා දෙනු ඇත.

5.9 අයදුම්පත් ඉදිරිපත් කිරීම

අදාළ ආදර්ශ ආකෘති පත්‍රයට අනුවම සකස් කළ වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් සහ ඊට විරුද්ධව කෙරෙන කරුණු දැක්වීම් මෙම චක්‍රලේඛයේ සඳහන් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර අදාළ රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශ සහිතව රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යාංශය ලේකම් වෙත යොමු කළ යුතුය.

වාර්ෂික ස්ථාන මාරු කමිටු තීරණ හා සමාලෝචන කමිටු තීරණ වලින් පසු වාර්ෂික ස්ථාන මාරුවීම් වල අවලංගු කිරීම්, සංශෝධනය කිරීම්, කල් දැමීම් පිළිබඳ සියලුම ඉල්ලීම් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි ආකෘති පත්‍ර **05 A සහ 05 B** මගින් නියමිත දිනට පෙර රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත එවිය යුතුය.

5.10 **වාර්ෂික නොවන ස්ථාන මාරු**

පරිපාලනමය අවශ්‍යතා, සේවා අවශ්‍යතා සහ විනය හේතු මත රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යාංශ ලේකම් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ආවරණ අනුමැතියට යටත්ව ස්ථාන මාරු නියෝග නිකුත් කෙරේ. සාමාන්‍ය රාජකාරි කටයුතු වලට බාධාවක් නොවන සුහද ස්ථාන මාරු ඉල්ලීම්ද, නිලධරයන්ගේ හදිසි වූද, සානුකම්පිතව සලකා බැලිය යුතු වූ කරුණු අඩංගු ඉල්ලීම්ද, අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ නිරීක්ෂණ හා නිර්දේශ ඇතිව ඉදිරිපත් කරන විට ඒ පිළිබඳව සලකා බලා අවශ්‍ය පියවර ගනු ලැබේ. එහෙත් වාර්ෂික ස්ථාන මාරු කමිටු වලදී හැර ශ්‍රී ලංකා පරිපාලන සේවා ශාඛාවේ දෛනිකව සිදු කෙරෙන කාර්යයක් වශයෙන් ස්ථාන මාරුවීම් සිදු නොකෙරේ.

| | කාර්යය | දිනය |
|---|---|---|
| 01. | වාර්ෂික ස්ථාන මාරු කමිටුව පිහිටු වීම. | ජුනි මස 01 වන දිනට පෙර |
| 02. | වාර්ෂික ස්ථාන මාරු දැන්වීම් නිකුත් කිරීම. | ජුනි මස 30 වන දිනට පෙර |
| 03. | සම්පූර්ණ කරන ලද වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍ර අදාල බලධාරියා වෙත ඉදිරිපත් කිරීම. | ජූලි මස 31 වන දිනට පෙර |
| 04. | අදාළ බලධරයා විසින් අයදුම්පත්‍ර ස්ථාන මාරු කමිටුවට භාර දීම | අගෝස්තු මස 10 වැනි දිනට පෙර |
| 05. | වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ ස්ථාන මාරු යෝජනා අදාල බලධාරියා වෙත ලිඛිතව භාර දීම. | අගොස්තු මස 31 වන දිනට පෙර |
| 06. | යෝජිත වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ දැන්වීම් නිකුත් කිරීම සහ වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු පත් කිරීම | සැප්තැම්බර් මස 15 වන දිනට පෙර |
| 07. | ස්ථාන මාරු වීම් පිළිබඳ සමාලෝචන කමිටු සඳහා අභියාචන භාර ගැනීමේ අවසන් දිනය | සැප්තැම්බර් මස 30 වන දිනට පෙර |
| 08. | වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව විසින් යෝජිත වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් වන තම ලිඛිත නිර්දේශ අදාල බලධාරියා වෙත ලිඛිතව භාර දීම. | ඔක්තෝම්බර් මස 15 වන දිනට පෙර |
| 09. | අවසාන ස්ථාන මාරු වීම් නියෝග නිකුත් කිරීම | නොවැම්බර් මස 01 වන දිනට පෙර |
| 10. | වාර්ෂික ස්ථාන මාරු බලාත්මක කිරීම | ජනවාරි මස 01 වන දින සිට |
| 11 | සේවා ස්ථාන වලට මුදාහරින ලද, තම සේවා ස්ථානයට වාර්තාකරන ලද නිලධාරීන් පිළිබඳ තොරතුරු රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත යොමු කිරීම | පෙබරවාරි මස 01 ට පෙර |

07. ස්ථාන මාරු තීරණ වලට එරෙහි අභියාචනා සම්බන්ධ ක්‍රියා පටිපාටිය

7.1 ස්ථාන මාරු කිරීමක් පිළිබඳව දෙන ලද නියෝගයකට එරෙහිව කිසියම් රජයේ නිලධරයෙකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කරන්නේ නම්, එම අභියාචනය මෙහි දැක්වෙන ආකෘතිපත්‍ර අංක 05 A සහ 05 B අනුව පමණක් ඉදිරිපත් කළ යුතු වන්නේය. තව ද, තමන් විසින් ඉදිරිපත් කරනු ලබන කරුණු තහවුරු කිරීමට අදාළ ලියවිලි වල සහතික කළ පිටපත් එම අභියාචනය සමඟ ඉදිරිපත් කිරීමටද, ඔහු ක්‍රියා කළ යුතු වන්නේය.

7.2 රජයේ නිලධරයෙකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කළ යුතු වන්නේ, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් මඟින් වන අතර, එම අභියාචනයේ පිටපතක් අදාළ පරිදි දෙපාර්තමේන්තු ප්‍රධාන හා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත ද යොමු කළ යුතු වන්නේය. තමන් වෙත ඉදිරිපත් වන අභියාචනය අප්‍රමාදවම තම නිරීක්ෂණ සහිතව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කිරීම රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ වගකීම වන්නේය. නිලධරයාට තම කැමැත්ත පරිදි, අභියාචනයේ ප්‍රගමන පිටපතක් සෘජුවම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ හැක්කේය.

7.3 ස්ථාන මාරු කිරීමේ නියෝගයකට එරෙහිව ඉදිරිපත් කරනු ලබන අභියාචනයක්, එම ස්ථාන මාරු කිරීමේ නියෝගය අදාළ රජයේ නිලධරයා වෙත ලද දින සිට දින 14 ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු වන්නේය. නියමිත කාලය තුළදී නොවන අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රතික්ෂේප කරනු ලබන්නේය.

7.4 කොමිෂන් සභාව වෙත යොමු කිරීම සඳහා නිලධරයෙකු විසින් භාර දෙනු ලබන අභියාචනය අදාළ සියලු ලිපිගොනු, ලිපි ලේඛන හා වාර්තා ආදිය ද, ඊට අදාළ තම නිරීක්ෂණ ද, නිර්දේශද සහිතව එම අභියාචනය ලැබී දින 15 ක් ඇතුළත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කිරීමට අදාළ දෙපාර්තමේන්තු ප්‍රධාන හා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්වරයා වග බලා ගත යුතු වන්නේය. එතකුදු වුවත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයෙහි XVIII වැනි පරිච්ඡේදයේ සඳහන් වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධ අභියාචනා අදාළ ලිපිගොනු, ලිපි ලේඛන, වාර්තා, නිරීක්ෂණ හා නිර්දේශ සමඟ **නොවැම්බර් මස 15** වැනි දිනට ප්‍රථම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වන්නේය.

7.5 මෙම පරිච්ඡේදයෙහි සඳහන් නියමයන්ට අනුගතව තම අභියාචන ඉදිරිපත් කිරීම සෑම රජයේ නිලධරයෙකුගේම වගකීම වන අතර, ඊට පටහැනිව ඉදිරිපත් කරනු ලබන අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සලකා බලනු නොලබන්නේය.

7.6 ඉහත 7.4 වගන්තියේ සඳහන් ලියවිලි ලැබී දින 15 ක් ඇතුළත, ස්ථාන මාරු කිරීමේ නියෝගයකට එරෙහිව රජයේ නිලධරයෙකු විසින් ඉදිරිපත් කර ඇති අභියාචනා සම්බන්ධයෙන් තීරණයක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ඇත්තේය.

7.7 ඉහත සඳහන් පරිදි ඉදිරිපත් කර ඇති අභියාචනයක් සම්බන්ධයෙන් වන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය සෘජුවම අභියාචක වෙත දන්වනු ලබන අතර, එහි පිටපත් අදාළ පරිදි රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් හා දෙපාර්තමේන්තු ප්‍රධාන වෙත යවනු ලබන්නේය.

7.8 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගයකින් හෝ තීරණයකින් හෝ අතෘප්තියට පත්වන රජයේ නිලධරයෙකුට 2002 අංක 04 දරණ පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරිය පනතේ සඳහන් විධිවිධාන වලට අනුකූලව පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරිය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම් ඇත්තේය.

ජේ. දඩල්ලගේ,

ලේකම්,

රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය.

.

ආකෘති අංක 01

**ස්ථාන මාරු අයදුම්පත**

**(ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරීන් සඳහා)**

1. පෞද්ගලික තොරතුරු
   - 1.1. නම(පත්වීම් ලිපියේ පරිදි) : ..........
   - 1.2. නම වෙනස් කර ඇත්නම් එම නම මුලකුරු සමඟ : ..........
   - 1.3. සම්පූර්ණ නම : ..........
   - 1.4. ජාතික හැඳුනුම්පත් අංකය : ..........
   - 1.5. උපන් දිනය :
   - 1.6. ස්ත්‍රී / පුරුෂ භාවය :
   - 1.7. මුල් පත්වීම් දිනය : ..........
   - 1.8. පෞද්ගලික ලිපිනය : ..........
   - 1.9. විවාහක /අවිවාහක බව :..........
     - i. කලත්‍රයාගේ නම : ..........
     - ii. රැකියාව :..........
     - iii. සේවා ස්ථානය :..........
     - iv. දරුවන් පිළිබඳ විස්තරඃ දරුවන් පිළිබඳ තොරතුරු

| අංකය | දරුවන්ගේ නම් | වයස | ඉගෙනුම ලබන පාසැල් |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

   - 1.10. දුරකථන අංකය : නිවස : .......... ජංගම ..........

2. වර්තමාන සේවා ස්ථානය :..........

   - 2.1අමාත්‍යාංශය/පළාත්සභාව :..........
   - 2.2 දෙපාර්තමේන්තුව/ පළාත් අමාත්‍යාංශය : ..........
   - 2.3කාර්යාලීය ලිපිනය : ..........
     ..........
   - 2.4 කාර්යාලීය දුරකථන අංකය :..........
   - 2.5 සේවයට වාර්තා කළ දිනය : ..........
   - 2.6 2016.12.31 දිනට සේවා කාලයඃ අවු :..........මාස :..........දින :..........

3. තනතුර
   - 3.1. වර්තමාන තනතුරු නාමය : ..........
   - 3.2. එම තනතුරට පත්වූ දිනය : ..........

4. ස්ථාන මාරු ඉල්ලීමට හේතුව : ..........
   ..........
   ..........

5. පූර්ව සේවා ස්ථාන :

| තනතුර | සේවා ස්ථානය (ප්‍රියමනාප සේවා ස්ථානවල සේවා කාලයද ඇතුළුව) | කාල සීමාව |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |

6. ස්ථාන මාරු ඉල්ලුම් කරන සේවා ස්ථානඃ

| තනතුර | සේවා ස්ථානය |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |

ඉහත සඳහන් සියළු තොරතුරු සත්‍ය බවට සහතික කරමි. මා විසින් ස්ථාන මාරු ලැබීමට ඉල්ලා ඇති ඕනෑම සේවා ස්ථානයකට / එම ස්ථානවලට ඉතා ආසන්න ස්ථානයකට ස්ථාන මාරු ලැබීමට කැමැත්ත මින් පළ කරන බවත් එම ඉල්ලීම මත, ලබා දෙන ස්ථාන මාරුව සඳහා නියෝග නිකුත් කළ පසු එම නියෝගය අවලංගු කිරීමට හිමිකමක් නොමැති බවත් පිළිගනිමි.

දිනය : .......................... අත්සනඃ ..............................................

ආකෘති පත්‍ර අංක 02

**ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් උපලේඛනය - 2017 වර්ෂය**

අමාත්‍යාංශය : ..........................................................................................

| අනු අංකය | නිලධාරියාගේ නම හා ජාතික හැඳුනුම්පත් අංකය | පත්වීම් දිනය හා මාධ්‍යය | පෞද්ගලික ලිපිනය | උපන් දිනය හා 2016.12.31 දිනට වයස | පූර්ව සේවා ස්ථාන හා කාලසීමාව | මාරුවීම ඉල්ලීමට හේතු | මාරුවීමට කැමති ස්ථානය |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

සියලුම නිලධාරීන්ගේ ඉල්ලුම්පත් මෙම ලේඛනයට ඇතුළත් කර ඇති බව සහතික කරමි.

සකස් කළේ : නම : ............................................................................................ අත්සන : .......................................................

පරීක්ෂා කළේ : නම : ............................................................................................ අත්සන : .......................................................

දිනය : ...............................

..........................................................................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

ආකෘති පත්‍ර අංක 03

**එක් සේවා ස්ථානයක අවුරුදු 05 කට වැඩි කාලයක් සේවය කර ඇති සියළුම නිලධාරීන්ගේ විස්තර මෙහි අනිවාර්යයෙන්ම ඇතුළත් විය යුතු බව සළකන්න. (2016.12.31 දිනට)**

**(වැඩිම සේවා කාලයක් ඇති නිලධාරීන්ගේ නම් මුලින්ම ඇතුළත් විය යුතු බව සළකන්න).**

අමාත්‍යාංශය : ...................................................................................

| අනු අංකය | නිලධාරියාගේ නම : (මයා / මිය / මෙය යන්න සඳහන් කරන්න) | පත්වීම් දිනය | තනතුර / ශ්‍රේණිය හා මාධ්‍යය | උපන්දිනය හා 2016.12.31 දිනට වයස | වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය 2016.12.31 දිනට | දැනට පදිංචි ප්‍රදේශය හා ලිපිනය | මුල් පත්වීමේ සිට සේවා ස්ථාන හා කාලසීමාවන් | වාර්ෂික ස්ථානමාරු සඳහා අයදුම් කර තිබේද? අයදුම් කර නොමැති නම් ස්ථාන මාරුවක් ලැබුණහොත් සේවය කිරීමට කැමති ස්ථාන 03ක් |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | |

සකස් කළේ : නම : ............................................................................................ අත්සන : ..........................................

පරීක්ෂා කළේ : නම : ............................................................................................ අත්සන : ..........................................

දිනය : ..............................

.........................................................................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

**ආකෘති පත්‍ර අංක : 04**

**ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරුවීම් වලට විරුද්ධව කරුණු දැක්වීම් පත්‍රය**

| ස්ථාන මාරුවීම් ලේඛනයේ අනන්‍යතා අංකය : ………………………… |
|---|

අමාත්‍යාංශය : …………………………

(අ) නිලධාරියා විසින් සම්පූර්ණ කළ යුතුය.

1. I. නිලධාරියාගේ සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :
…………………………
………………………… මයා / මිය / මෙනවිය

II. ස්ථිර ලිපිනය :
…………………………

III. පදිංචි ස්ථානයේ ලිපිනය :
…………………………

IV. 2017 වර්ෂයේ පදිංචි ස්ථානය වෙනස් වන්නේ නම් නව පදිංචි ස්ථානයේ ලිපිනය :
…………………………

2. ස්ථාන මාරු කරන ලද සේවා ස්ථානය : …………………………
3. තනතුර හා ශ්‍රේණිය : …………………………

3.1. සේවයට ඇතුළත් වු දිනය දිනය …………………………

3.2. විශේෂ ශ්‍රේණියට ඇතුළත් වූ දිනය : …………………………

4. උපන් දිනය :…………………………
5.

| සේවා විස්තර | පත් වූ දිනය | සේවා ස්ථානය සිට / දක්වා |
|---|---|---|
| ………………………… | ………………………… | ………………………… |
| ………………………… | ………………………… | ………………………… |
| ………………………… | ………………………… | ………………………… |

6 මා ඉල්ලා සිටිනුයේ දී ඇති ස්ථාන මාරුවීම අවලංගු කිරීමටය / සංශෝධනය කිරීමටය

7. ස්ථාන මාරුවීම් වලට විරුද්ධව කෙරෙන කරුණු දැක්වීම් කිරීමට හේතු : (පසු පිටෙහි සඳහන් කරන්න)

8. ස්ථාන මාරුව සංශෝධනය කළ යුතු / ලබා දිය යුතු සේවා ස්ථානය :

අමාත්‍යාංශය : …………………………

දෙපාර්තමේන්තුව : …………………………

දිනය : …………………………

…………………………

නිලධාරියාගේ අත්සන

(ආ) දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිරීක්ෂණ :

I. කාර්යාල තොරතුරු අනුව ඉහත විස්තර නිවැරදි වේ.

II. මෙම ස්ථාන මාරුව අවලංගු කිරීම / සංශෝධනය කිරීම සම්බන්ධයෙන් වන කරුණු දැක්වීම හා නිර්දේශය :

.......................................................................................................................................................

.......................................................................................................................................................

දිනය : ........................................................................ ..............................................

අමාත්‍යාංශ ලේකම් අත්සන

(අනවශ්‍ය වචන කපා හරින්න. සම්පූර්ණ තොරතුරු ඇතුළත් නොකළ අයදුම්පත් ස්ථාන මාරු සමාලෝචන කමිටුව විසින් සළකා බලනු නොලැබේ. වැඩි විස්තර ඇත්නම් පසුපිට සඳහන් කරන්න.)

**වාර්ෂික ස්ථානමාරු පිළිබඳ අභියාචනා -**

............... වාර්ෂික ස්ථානමාරු තීරණ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කිරීම - අභියාචක පිළිබඳ තොරතුරු

**අ. පෞද්ගලික තොරතුරු**

| | |
|---|---|
| 01. මුලකුරු සමඟ නම:- | |
| 02. තනතුර හා පන්තිය | |

| | | | |
|---|---|---|---|
| 03. උපන්දිනය :-<br>YYYY/MM/DD | 04. වයස :- (2016.12.31 දිනට) | 05. ජාතික හැඳුනුම් පත් අංකය:- | 06. ස්ත්‍රී/පුරුෂ භාවය |

| | | |
|---|---|---|
| 07.ස්ථිර ලිපිනය :- | 08. තාවකාලික ලිපිනය:- | 09. දුරකථන අංකය<br>කාර්යාලය :-<br>පෞද්ගලික :- |
| 10. විවාහක /අවිවාහක බව | 11. කලත්‍රයාගේ නම:- | 12. කලත්‍රයාගේ රැකියාව හා සේවා ස්ථානය:- |
| 13. දරුවන් ගණන | 14. ඔවුන්ගේ වයස:- | 15. ඉගෙනුම ලබන පාසැල්:- |

**ආ. සේවා තොරතුරු**

| | |
|---|---|
| 16. තනතුරට පත් වූ දිනය:- | |
| 17.වර්තමාන සේවා ස්ථානය :- | 18.සේවා ස්ථානය පිහිටි නගරය:- |
| 19.වර්තමාන සේවා ස්ථානයට වාර්තාකල දිනය:-<br>YYYY/MM/DD | 20. වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය(2016.12.31 දිනට)<br>අවු..... මාස..... දින....... |
| 21. ප්‍රතිලාභ ලබන (ප්‍රියමනාප) සේවා ස්ථානයක / ස්ථානවල සේවය කර තිබේද? | |

| 22. රජයේ සේවයේ පූර්ව සේවා ස්ථාන | සේවා ස්ථානය | | ප්‍රිය මනාප සේවා ස්ථානයකි/ ප්‍රිය මනාප නොවන සේවා ස්ථානයකි | සේවා කාලය | |
|---|---|---|---|---|---|
| | 1 | | | සිට | දක්වා |
| | 2 | | | | |
| | 3 | | | | |
| | 4 | | | | |
| | 5 | | | | |
| | 6 | | | | |

**ඇ. ස්ථාන මාරු ඉල්ලීම පිළිබඳ තොරතුරු (අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න )**

| 23 | වාර්ෂික ස්ථාන මාරු අයදුම් කර | ඇත | | ස්ථාන මාරු අයදුම් කර ඇත්නම් අයදුම් කර ඇති සේවා ස්ථාන<br>1.<br>2.<br>3. |
|---|---|---|---|---|
| | | නැත | | |
| ස්ථාන මාරු ලැබී තිබේ නම් එම සේවා ස්ථානය | | | | |

24. ස්ථාන මාරු චක්‍රය සමන්විත වන නිලධාරීන් ගණන .......................................

| 25. ස්ථානමාරු සමාලෝචන කමිටුවට අයදුම් කර | ඇත | |
|---|---|---|
| | නැත | |

26. සමාලෝචන කමිටුව වෙත කරන ලද ඉල්ලීම පිළිබඳ තොරතුරු

| ස්ථාන මාරුව අවලංගු කිරීම | | ස්ථාන මාරුව සංශෝධනය කිරීමට ඉල්ලුම් කළේ නම් එසේ ඉල්ලුම් කල සේවා ස්ථාන<br>01...............................................................................<br>02...............................................................................<br>03............................................................................... |
|---|---|---|
| සංශෝධනය කිරීම | | |
| නව ස්ථාන මාරුවක් ලබා ගැනීම | | |

27. ස්ථානමාරු සමාලෝචන කමිටු තීරණය

28. ස්ථාන මාරු සමාලෝචන කමිටු තීරණයට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හේතු

1. ..........................................................................................................
2. ..........................................................................................................
3. ..........................................................................................................

29. ඉහත හේතු සනාථ කිරීමට අදාළ ලිඛිත සාධකවල සහතික කළ පිටපත් පහත දැක්වෙන ඇමුණුම් වශයෙන් යා කර ඇත.

ඇමුණුම (01) ..........................................................................................

ඇමුණුම (02) ..........................................................................................

ඇමුණුම (03) ..........................................................................................

30. ඉල්ලා සිටිනු ලබන සහන

1. ..........................................................................................................
2. ..........................................................................................................
3. ..........................................................................................................

ඉහත දක්වා ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි.

.......................................

දිනය

..............................................

අත්සන

**ඈ. අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය**

නිලධාරියා/නිලධාරිනිය විසින් ඉදිරිපත් කර ඇති ඉහත සඳහන් තොරතුරු ඔහුගේ/ඇයගේ පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි බව සහතික කරමි. 2017 වාර්ෂික ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන අභියාචනය නිර්දේශ කරමි. පහත සඳහන් හේතු මත නිර්දේශ නොකරමි.

i. ................................................................................................
ii. ................................................................................................
iii. ................................................................................................

.......................................                ...............................................

දිනය                අත්සන

ඉ. ස්ථාන මාරු බලධරයාගේ නිර්දේශය

i. ස්ථාන මාරු චක්‍රය සම්බන්ධ වන නිලධාරීන් ගණන: ........................................................

ii. අභියාචනය පිළිබඳ නිර්දේශය: ..............................................................................................

..............................................................................................................................................

.......................................                ...............................................

දිනය                අත්සන

අකෘති පත්‍ර අංක : 05 B

**වාර්ෂික ස්ථානමාරු පිළිබඳ අභියාචනා -**

.............. වාර්ෂික ස්ථානමාරු තීරණ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කිරීම - අනුප්‍රාප්තික නිලධාරියා පිළිබඳ තොරතුරු

I. අභියාචක නිලධාරයාගේ නම හා තනතුරු: ........................................................................................................

II. අභියාචක නිලධරයාට අදාළ අනුප්‍රාප්තික නිලධාරියා පිළිබඳ තොරතුරු

**අ. පෞද්ගලික තොරතුරු**

| | | | |
|---|---|---|---|
| 01. මුලකුරු සමඟ නම:- | | | |
| 02. තනතුර හා පන්තිය | | | |
| 03. උපන්දිනය :- YYYY/MM/DD | 04. වයස :- (2016.12.31 දිනට) | 05. ජාතික හැඳුනුම් පත් අංකය:- | 06. ස්ත්‍රී/පුරුෂ භාවය |
| 07.ස්ථිර ලිපිනය :- | 08. තාවකාලික ලිපිනය:- | 09. දුරකථන අංකය<br>කාර්යාලය :-<br>පෞද්ගලික :- | |
| 10. විවාහක /අවිවාහක බව | 11. කලත්‍රයාගේ නම:- | 12. කලත්‍රයාගේ රැකියාව හා සේවා ස්ථානය:- | |
| 13. දරුවන් ගණන | 14. ඔවුන්ගේ වයස:- | 15. ඉගෙනුම ලබන පාසැල්:- | |

**ආ. සේවා තොරතුරු**

| | |
|---|---|
| 16. තනතුරට පත් වූ දිනය:- | |
| 17.වර්තමාන සේවා ස්ථානය :- | 18.සේවා ස්ථානය පිහිටි නගරය:- |
| 19.වර්තමාන සේවා ස්ථානයට වාර්තාකල දිනය:- YYYY/MM/DD | 20. වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය (2016.12.31 දිනට)<br>අවු..... මාස..... දින....... |
| 21. ප්‍රතිලාභ ලබන (ප්‍රියමනාප) සේවා ස්ථානයක / ස්ථානවල සේවය කර තිබේද? | |

| 22. රජයේ සේවයේ පූර්ව සේවා ස්ථාන | සේවා ස්ථානය | | ප්‍රිය මනාප සේවා ස්ථානයකි/ ප්‍රිය මනාප නොවන සේවා ස්ථානයකි | සේවා කාලය | |
|---|---|---|---|---|---|
| | 1 | | | සිට | දක්වා |
| | 2 | | | | |
| | 3 | | | | |
| | 4 | | | | |
| | 5 | | | | |
| | 6 | | | | |

**ඇ. ස්ථාන මාරු ඉල්ලීම පිළිබඳ තොරතුරු (අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න )**

| 23 | වාර්ෂික ස්ථාන මාරු අයදුම් කර | ඇත | | ස්ථාන මාරුව සංශෝධනය කිරීමට ඉල්ලුම් කළේ නම් එසේ ඉල්ලුම් කල සේවා ස්ථාන<br>1.<br>2.<br>3. |
|---|---|---|---|---|
| | | නැත | | |
| ස්ථාන මාරු ලැබී තිබේ නම් එම සේවා ස්ථානය | | | | |

| 24. ස්ථාන මාරු සමාලෝචන කමිටුවට අයදුම් කර | ඇත | |
|---|---|---|
| | නැත | |

25. සමාලෝචන කමිටුව වෙත කරන ලද ඉල්ලීම

| ස්ථාන මාරුව අවලංගු කිරීම | | ස්ථාන මාරුව සංශෝධනය කල යුතු / නව ස්ථාන මාරුවීමක් ලබා දිය යුතු සේවා ස්ථාන<br>01.........................................................<br>02.........................................................<br>03......................................................... |
|---|---|---|
| සංශෝධනය කිරීම | | |
| නව ස්ථාන මාරුවක් ලබා ගැනීම | | |

26. ස්ථානමාරු සමාලෝචන කමිටු තීරණය

27. රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කර තිබේ ද /නැද්ද යන්න

........................................................................................................................

28. අභියාචකගේ ඉල්ලීම ඉටුකළහොත් අනුප්‍රාප්තික නිලධරයාට අගතියක් නොවන පරිදි ස්ථාන මාරු චක්‍රය ක්‍රියාත්මක කිරීම පිළිබඳ රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යාංශය ලේකම්ගේ නිර්දේශ:

....................................................................................................................................................................................................................................

....................................................................................................................................................................................................................................

....................................................................................................................................................................................................................................

....................................................................................................................................................................................................................................

..................................                                                                                    ..............................

දිනය                                                                                    අත්සන .